සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 08 - 2024

## නර්තනය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 - 05 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

01. "තෙයියත් තෙයියත් තෙයියත් තාම් තේයි තත්තක තෙයියත් තාම්" යනු,
    1) 4 වන පා සරඹය යි  2) 6 වන පා සරඹය යි  3) 8 වන පා සරඹය යි  4) 9 වන පා සරඹය යි

02. "ජිං තරිකිට ජිං කඩතක" යන අලංකාර බෙර පදය වාදනය කරනුයේ,
    1) මාත්‍රා 2+2 තාල රූපයටය  2) මාත්‍රා 3+3 තාල රූපයටය
    3) මාත්‍රා 4+4 තාල රූපයටය  4) මාත්‍රා 2+2 තාල රූපයටය

03. ඇල සරඹය; ගොඩ සරඹවල,
    1) හයවන සරඹයයි  2) පස්වන සරඹයයි  3) හතරවන සරඹයයි  4) හත්වෙනි සරඹයයි

04. බලයට හා ශක්තියට අධිපති දුර්ගා දෙවියන් පුද ලබන්නේ,
    1) නත්තල් උත්සවයේ දී ය.  2) නව රාත්‍රි උත්සවයේ දී ය.
    3) රාමසාන් උත්සවයේ දී ය.  4) හජ්ජි උත්සවයේ දී ය.

05. තාල රූපයක් ගොඩනැගීමට අවශ්‍ය අඩුම මාත්‍රා ගණන වනුයේ,
    1) මාත්‍රා 3 කි  2) මාත්‍රා 1 කි  3) මාත්‍රා 2 කි  4) මාත්‍රා 4 කි

- ප්‍රශ්න අංක 06 - 10 දක්වා දී ඇති වගන්ති වල, හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.

(අංග, තුරගා, සවරන්, ඉරට්ටිය, ආගමික)

06. පතුරු නැටුම විනෝදාස්වාදය මෙන්ම ........................................ විශ්වාසය මත ගොඩ නැගුණු නැටුමකි.
07. නර්තන මාධ්‍යයෙන් සත්ත්ව චරිත නිරූපණය කිරීමේදී, සත්ත්වයාගේ විවිධත්වය දැක්වීම සඳහා ......................................, ප්‍රත්‍යංග, උපාංග මූලික කර ගත යුතුය.
08. උඩරට නර්තන සම්ප්‍රදායේ කස්තිරමට සමාන ව පහතරට නර්තන සම්ප්‍රදායේ .................................. භාවිතා කරයි.
09. ''සිරියල් දීලා කට රතු කරලා,'' යන කවිය........................................... ගායනා වලට අයත් වේ.
10. දොං ජිංත ගත දොංත බෙර පදය ...................................................... වන්නමට වාදනය කෙරේ.

- ප්‍රශ්න අංක 11 - 15 දක්වා දී ඇති වගන්ති හරි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන තුළ යොදන්න.

11. තාලම්පටින් නිකුත් වන හඬ දෙකකි. එය තිත් හා තෙයි වේ. (   )
12. මාත්‍රා 4+4 තාල රූපයට වෛරොඩි වන්නම ගායනා කෙරේ (   )
13. ගොඩ සරඹ නර්තනයේ දී මධ්‍යලයට නර්තනය කිරීම, සමගුණ නර්තනය කිරීම ලෙස හඳුන්වයි. (   )
14. උඩරට නර්තන සම්ප්‍රදායේ පා සරඹ නැටීම, සබරගමු සම්ප්‍රදායේ හඳුන්වනුයේ මණ්ඩිපද නැටීම යනුවෙනි. (   )
15. ගොප් ගෙඩිය සරල සැරසිලි අංගයකි. (   )

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්න වලට අදාළව දී ඇති පද හතර අතුරින් නොගැලපෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

16. 1) කස්තිරම 2) ඉරට්ටිය 3) කලාසම 4) බෙරපදය
17. 1) වන්නම් 2) සවරම් 3) තාලම් 4) පතුරු
18. 1) ගැටබෙරය 2) මහනුවර 3) කොහොඹාකංකාරිය 4) පහන් මඩුව
19. 1) තම්මැට්ටම 2) හොරණෑව 3) රබාන 4) දවුල
20. 1) සමගුණ 2) දෙගුණ 3) සිව්ගුණ 4) තුන්ගුණ

---

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකක් ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

01. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු හිස්තැනෙහි ලියන්න.

i. ලීය දෙපස සරසා රැලි අලවා සකස් කරන ලද උපකරණය ...................................... නැටුම සඳහා භාවිතා කරයි.
ii. තත් දිත් තොං නං යනු පහතරට බෙරය මුල් කර ගත් .................................................... වේ.
iii. ඇම්බැක්කේ දේවාලයේ වැඩි වශයෙන් දක්නට ලැබෙන කැටයම් ලෙස ....................................... කැටයම් හඳුන්වා දිය හැකිය.
iv. ගැඹුරු හඬක් නිපදවීමට හරක් සිවිය භාවිතා කරනුයේ, ................................ බෙරය සඳහාය.
v. මාත්‍රා 3+3 තාල රූපයට .............................. වන්නම ගායනා කෙරේ (ල. 10)

02. නර්තන, ගායන, වාදන යන ප්‍රායෝගික අංග ලිඛිතව දැක්වීමේ දී ප්‍රස්තාරකරණය වැදගත් වේ.

i. මාත්‍රා 3+3 තාල රූපයට අයත් බෙර පදය ප්‍රස්තාර කරන්න
ii. තුරගා වන්නමේ අඩව්ව ලියා දක්වන්න
iii. ''සූරිය කුළ ඇති හිරු දෙවියන්නේ,''යන කවියේ පද දෙකක් නියමිත තිත් රූපයට ප්‍රස්තාර කරන්න (ල. 10)

03. දේශීය නර්තන කලාවේ උන්නතියට රූකම් මනා පිටුවහලක් වේ.

i. ගම්පල යුගයේ දැව මගින් ඉදිකළ ආගමික සිද්ධස්ථානයක් නම් කරන්න
ii. රූකම්වල ප්‍රභේද නම් කොට ඒවා දැකිය හැකි ස්ථාන නම් කරන්න.
iii. රූකම් ආරක්ෂා කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග 2 ක් යෝජනා කරන්න (ල. 10)

04. දේශීය නර්තන සම්ප්‍රදායන් සඳහා ආවේණික වූ වාද්‍ය භාණ්ඩ පවතී.

i. දේශීය නර්තන සම්ප්‍රදායන් නම් කර ඒ හා බැඳි ප්‍රධාන වාද්‍ය භාණ්ඩ නම් කරන්න
ii. පහතරට බෙරය වාදනය කරන අවස්ථා තුනක් නම් කරන්න
iii. පහතරට බෙරය ඇඳ කොටස් නම් කරන්න (ල. 10)

05. පහත සඳහන් මාතෘකා අතරින් 02 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න. (කරුණු හතරකට වැඩි විය යුතුය)

i. සතර බීජාක්ෂර
ii. ගැමි නැටුම
iii. වන්නම්
iv. ගොඩ සරඹ
v. ගොප් සැරසිලි (ල. =10)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 08 - 2024

## නර්තනය . ප්‍රායෝගික පරීක්ෂණය

නම / විභාග අංකය:

01. i. කැමති ජන ගීයක් ගායනය (ල. 05)
    ii. නම් කරන ලද ජන ගීයක් ගායනය (ල. 05)

02. සුළු තනි තිතට බෙර පදයක් වාදනය (ල. 10)

03. ගොඩ සරඹ 3-6 දක්වා කස්තිරම සමඟ නර්තනය (ල. 10)

04. වන්නම නර්තනය කිරීම (තුරගා/ වෛරොඩි) (ල. 10)

05. ගැමි නැටුම් (සවරම්/ පතුරු/ කුළු/ ලී) නර්තනය (ල. 10)

(මුළු ලකුණු 50)